# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

# 9. ආරක්ෂක නිලධාරීන්

වාහන නැවැත්වීමේ ස්ථාන ඇතුළුව සියලුම ආයතන වල සේවය කරන ආරක්ෂක නිලධාරීන්ට මෙය අදාළ වේ.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**සේවා යෝජකයා**

- දෑත්වල පිරිසිදුභාවය, ශාරීරික දුරස්ථභාවය සහ ශ්වසන ආචාර විධි (කැස්ස / කිවිසුම් යාමේදී ටිෂු භාවිතයෙන් හෝ වැලමිට ඇතුල් පසින් ඔබේ මුඛය සහ නාසය ආවරණය කරන්න, භාවිතා කළ ටිෂු සහ මුහුණු ආවරණ වැසිය හැකි කසල බඳුනකට ආරක්ෂිතව බැහැර කිරීම වැනි) පිළිබඳව සේවකයන් මනාව දැනුවත් කරන්න.
- මුහුණු ආවරණ , ඇල්කොහොල් අඩංගු අත් පිරිසිදුකාරක යනාදිය අවශ්‍ය ප්‍රමාණයට ඇති බවට සහතික වන්න.
- අවශ්‍යතාවය අනුව අවම කාර්ය මණ්ඩලයකින් සේවාව සලසන්න.
- සේවකයින්ගේ සෞඛ්‍යය පිළිබඳව දිනපතා විමසීමේ ක්‍රමයක් අනුගමනය කරන්න (උණ සහ කැස්ස / සෙම්ප්‍රතිශ්‍යාව වැනි ශ්වසන රෝග ලක්ෂණ විමසන්න).
- උණ පරීක්ෂා කිරීම සඳහා උෂ්ණත්වමාන භාවිතා කළ හැකි නමුත් අත්‍යවශ්‍ය නොවේ. ඇතුල්වන ස්ථාන වල උෂ්ණත්වය පරීක්ෂා කිරීමට නම්, ස්පර්ශ නොකරන අධෝරක්ත උපාංග වඩාත් සුදුසු වන අතර ඒවායේ නිසි භාවිතය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය.
- ගනුදෙනුකරුවන් සමඟ සෘජුව මැදිහත් වන සියලුම සේවකයින් මුහුණු ආවරණ පළඳින බවටත්, අවශ්‍ය පරිදි දෑත් පිරිසිදුව තබා ගන්නා බවටත් සහතික වන්න.
- කාර්ය මණ්ඩලයට දිනපතා සෝදා පිරිසිදු කරනලද ඇඳුම් ඇඳීම සඳහා ප්‍රමාණවත් නිල ඇඳුම් ඇති බවට සහතික වන්න.
- විවේකාගාරවල ප්‍රමාණවත් ඉඩකඩ සහ වාතාශ්‍රය හොඳින් ලැබෙන බව සහතික කිරීම හා හැකි නම් සේවා මුරය අවසානයේ ස්නානය කිරීමට/සේදීමට පහසුකම් ලබා දීම.
- කාර්ය මණ්ඩලයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක අත් සේදීම සඳහා (දියර සබන් සහිත) බේසමක් පහසුකම් සලසන්න (උ.දා. - පිවිසුම් සහ පිටවීමේ දොරටුවල) මේ සඳහා පාදයෙන් ක්‍රියා කල හැකි හෝ ස්වයංක්‍රියව ක්‍රියාත්මක වන ජල කරාම වඩා යෝග්‍යයි.
- භාණ්ඩ (පෑන්, පොත්, කෝප්ප) හුවමාරු කර ගැනීමෙන් වළකින්න. පුද්ගලික අයිතම භාවිතා කරන්න.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකඟතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම ආයතන ප්‍රධානියාගේ / භාරකරුගේ වගකීම වේ.

**ආරක්ෂක නිලධාරියා**

- ඔබට උණ, කැස්ස සහ උගුරේ අමාරුව වැනි ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් කළමණාකරුට දැනුම් දෙන්න.
- සියළුම ගනුදෙනුකරුවන්ගෙන් / කාර්ය මණ්ඩලයෙන් අවම වශයෙන් එකිනෙකා අතර මීටරයක ශාරීරික දුරස්ථභාවය පවත්වා ගන්න සහ යහපත් ශ්වසන ආචාර ධර්ම පිළිපදින්න.
- නිතිපතා ඔබගේ වැඩ මුරය තුළදී සහ ඔබේ සේවා මුරයට පැමිණීමේදී හා පිටවීමේදී සබන් යොදා අත් සෝදන්න.
- ඔබේ වැඩ මුරය අවසානයේ ඔබත් හොඳින් පිරිසිදු වී ඔබේ නිල ඇඳුම ද සෝදන්න.
- ස්පර්ශ නොකරන අධෝරක්ත උෂ්ණත්වමානය කින් උෂ්ණත්වය මනින්න. උෂ්ණත්වය පරීක්ෂා කරන්නේ නම්, පුද්ගලයා ඉදිරියෙන් නොව පැත්තෙන් කරන්න.

- හැඳුනුම්පත් හෝ ලේඛන පරික්ෂා කරන්නේ නම්, කාඩ්පත හෝ ලේඛන ස්පර්ශ නොකරන්න. ඒ වෙනුවට ඔබට කියවීම සඳහා එය පෙන්වන්නැයි ඉල්ලා සිටින්න.
- නිරන්තරයෙන් ස්පර්ශ වන පෘෂ්ඨයන් නිතිපතා පිරිසිදු කර විෂබීජහරණය කරන්න (කවුන්ටර / ගේට්ටු).

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- දිනය ආරම්භයේ දී උපදෙස් දැනුම් දෙන්න




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

28/06/2020